පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල්

නර්තනය

වාරය - පළමු

ශ්‍රේණිය - 12

සැකසුම -වයි.එම්.ශ්‍රියානි පෙරේරා
ර/තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

Weekly School Department of Education,Sabaragamuwa Province/

## කාර්ය පත්‍රිකාව 06 -

- **නිපුණතාව 08** - **නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි**
- **නිපුණතා මට්ටම 8.1** - **ශ්‍රී ලාංකීය නර්තනය හා සංගීතය අතර ඇති සහසම්බන්ධතාව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි**
- **පාඩම 8.1** - **නර්තනය හා සංගීතය අතර සහසම්බන්ධතා විමසමු**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) සෑම ශාන්තිකර්මයක ම
   (i) ගායනය වාදනය පමණක් අන්තර්ගතව පවතී
   (ii) නර්තනය ගායනය වාදනය යන ප්‍රධාන කොටස් 03 අන්තර්ගතව පවතී
   (iii) ගායනය සහ නර්තනය යන කොටස් දෙක පමණක් අන්තර්ගතව පවතී
   (iv) ගායනය වාදනය නර්තනය සහ රංගනය යන කොටස් හතර අන්තර්ගතව පවතී

(02) දේශීය ජන සංගීතය සඳහා
   (i) ශාන්තිකර්ම කවි ගායනා පමණක් අන්තර්ගතය
   (ii) ගැමි ගායනා පමණක් අන්තර්ගතය
   (iii) වන්නම් පමණක් අන්තර්ගතය
   (iv) ඉහත සියල්ලම අන්තර්ගතය

(03) රූපවාහිනි මාධ්‍ය මගින් සංවිධානය කරන ලද විවිධ තරඟවලදී ප්‍රාසාංගික බව ඉස්මතු කිරීම සඳහා
   (i) භාරතීය සංගීත ඛණ්ඩ මෙන්ම බටහිර සංකේත ඛණ්ඩ මිශ්‍ර ව යොදා ගනී
   (ii) දේශීය සංගීත ඛණ්ඩ පමණක් යොදා ගනී
   (iii) භාරතීය සංගීත ඛණ්ඩ පමණක් භාවිත කරයි
   (iv) දේශීය සංගීත ඛණ්ඩ මෙන්ම භාරතීය හා බටහිර සංගීත ඛණ්ඩ යොදා ගනී

(04) දේශීය අවනද්ධ භාණ්ඩ යනු

(i) සම් යොදා සකස් කරන ලද භාණ්ඩ වේ
(ii) ලී යොදා සකස් කරන ලද භාණ්ඩ වේ
(iii) තහඩු යොදා සකස් කරන ලද භාණ්ඩ වේ
(iv) සම් සහ ලී යොදා සකස් කරන ලද භාණ්ඩ වේ

(05) භරත මුනිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රයේ ඇතුළත් රංග ශෛලීන් හෙවත් නාට්‍ය ශලින් දෙක වනුයේ
(i) ගීත නාට්‍ය සහ මුද්‍රානාට්‍ය වේ
(ii) නාට්‍ය ධර්මී නාට්‍ය සහ ලෝකධර්මී නාට්‍ය වේ
(iii) තාත්වික නාට්‍ය සහ නාට්‍ය ධර්මී නාට්‍ය වේ
(iv) ශෛලීගත නාට්‍ය හා ගීත නාට්‍ය වේ

**හිස්තැන් පුරවන්න**

(01) ශාන්තිකර්ම අන්තර්ගතයෙහි සාම්ප්‍රදායික ගායනා ස්වර සංකලන වලින් හා ................................................ පෝෂිතය.

(02) සංගීතය යනු යම්කිසි ස්වර පරාසයක් තුළ ගායනය කරමින් ප්‍රේක්ෂකයා හට ................................................ වින්දනයක් ලබා දෙන කලා මාධ්‍යකි.

(03) නර්තන කලාවේ පෝෂණයට දේශීය සංගීතය පමණක් නොව ................................................ සහ ................................................ සංගීත කලා දායක වී ඇත .

(04) සීමිත ස්වර රටාවක් මත ප්‍රසාරණය වූ කවි ගායනා මෙන්ම ගැමි ජන ජීවිතය හා බැඳි ගායනා සියල්ල ................................................ ලෙස වර්තමානය විකාශනය වී ඇත .

(05) බලි ශාන්තිකර්ම වල ගායනය ප්‍රධානය. ස්වර වාද්‍ය භාණ්ඩ නොමැති වුවත් ................................................ අදාළ සම්ප්‍රදායෙහි බෙර වාදනය සමග ඉදිරිපත් කරන ගායනා ඉතා මිහිරිය.

## II කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) ශාන්තිකර්ම වල අන්තර්ගත දේශීය ජන සංගීතය පිළිබඳ උදාහරණ දෙකක් දක්වන්න.

(02) නර්තනයෙහි ප්‍රාසාංගික බව තීව්‍ර කිරීමේ ලා සංගීතයෙන් ලැබෙන පිටුවහල අගයන්න.

(03) සංගීතය නව නිර්මාණකරණය සඳහා නර්තනය හා සබැඳි භාණ්ඩ තාල හා නාද රටා යොදාගෙන ඇති ආකාරය උදාහරණ සපයමින් විස්තර කරන්න.